දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. PSC/EST/06-01-134/2025

ඔබේ අංකය / உமது இல. / Your No. 07/A/02/01/19/2021

දිනය / திகதி 2025.10.13

ලේකම්,

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2025.08. දාතම අපැහැදිලි ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.04.02 දිනැතිව අනුමත කර, මෙම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් ඔබ අමාත්‍යාංශයට අයත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් කාරුණිකව දන්වමි.

දේශමාලි කුමාරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත: ආයතන අධ්‍යක්ෂ ජනරාල් - ඉහත බඳවා ගැනීමේ පටිපාටියේ සහතික කරන ලද පිටපතක් මේ සමග එවමි.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : අදාළ නොවේ

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
: යොමු අංකය : 07/A/02/01/19/2021 දිනය : 2024.11.10

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
: යොමු අංකය : DMS/0016/2023 දිනය : 2024.02.12

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
: යොමු අංකය : EST-2/02/REC/7541 දිනය : 2024.10.09

1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
: යොමු අංකය :PSC/EST/06-01-13/04/2025 දිනය : 2025.04.02
පළමු සංශෝධනය PSC/EST/06-01-13/04/2025 දිනය : 2025.07.16

**02.** **පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**03.** **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ

3.3 පැවරෙන කාර්ය පිළිබඳ පොදු නිර්වචනය:

විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳ ලබා ගත යුතු, ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ මූල්‍ය, මානව, භෞතික, ද්‍රව්‍යමය, තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය, මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් ඇතුළත් බහුකාර්යය ස්වරූපයෙන් යුතු අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත කළමනාකරණ සේවා වන ඉංජිනේරු, විද්‍යාත්මක, කෘෂිකර්ම සහ සත්ත්ව නිෂ්පාදන වැනි වෘත්තිමය සේවාවන්ට පරිපූරක වන්නා වූ කාර්යයන් ඉටුකරන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පැවරිය හැකිය.

**04.** **තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත**

සටහන : විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

**05.** **වැටුප් :**

5.1 වැටුප් කේත අංකය : MN 07 – 2025

5.2 මාසික වැටුප් පරිමාණය : රු.71,240 – 11 x 1,360 – 18 x 1,850 – 119,500/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | 04 | 75,320 |

nd

**06.** සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 1 | තාක්ෂණ නිලධාරි(ජීව වෛද්‍ය විශේෂ ශ්‍රේණිය) | විශේෂ ශ්‍රේණිය | 06 | (ඇමුණුම 01 ) |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : තාක්ෂණ නිලධාරි(ජීව වෛද්‍ය විශේෂ ශ්‍රේණිය) - 06

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

**7.1** බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 40% |
| කුසලතා | 60% |

**7.2** විවෘත බඳවා ගැනීම **:** අදාළ නොවේ

**7.3** සීමිත බඳවා ගැනීම **:**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

7.3.2.3 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.3.2.3 පළපුරුද්ද : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහම (05) උපයාගෙන තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි හා ඊට ආනුශාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

nq

iv. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

v. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : අදාළ නොවේ

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මඟින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතා අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලබයි.(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය ඇමුණුම 02 හි පරිදි විය යුතුය.)

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගතා පරීක්ෂණය | 100 | 40% |
| කළමනාකරණය | 100 | 40% |

7.3.4.1.1 විභාගය පවත්වන බලධාරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟිනි.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ)
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීම

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.3.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

**7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම**

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම්: අදාළ නොවේ

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.3 පළපුරුද්ද : i. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික(MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර හා නියමිත වැටුප් වර්ධක හයම (06) උපයාගෙන තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි හා ඊට ආනුශාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

iv. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම.

v. අනුමත කාර්යසාධන පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

vi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන්වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3. වයස : අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාව සඳහා ලකුණු ලබාදෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙළ මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම, පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය ඇමුණුම 03 හි පරිදි විය යුතුය.)

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.4.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **සේවා පළපුරුද්ද**<br>අදාළ මූලික සුදුසුකම් ඉක්මවා ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | 50 | අදාළ නොවේ |
| කුසලතාව<br>(අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටිය අනුව කුසලතාව තීරණය කරනු ලැබේ.) | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලබන කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

සටහන : ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර, අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලැබේ.

7.4.4.4.1 පවත්වන බලධාරියා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.4.5 රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම පළ කිරීම හෝ අභ්‍යන්තර නිවේදනයක් සහ වෙබ් අඩවියේ දැන්වීම් පල කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**08. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ** : අදාළ නොවේ

**09. භාෂා ප්‍රවීණතාව** : අදාළ නොවේ

**10. ශ්‍රේණි උසස් කිරීම** : අදාළ නොවේ

**11. තනතුරුවලට පත් කිරීම** : අදාළ නොවේ

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි** මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන සහ කොන්දේසි අදාළ වේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :** අදාළ නොවේ.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම** : අදාළ නොවේ

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**16.** මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**17. අන්තර්කාලීන විධිවිධාන** : අදාළ නොවේ

**සකස් කළේ :**
අත්සන :- ..........................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම -: ඩබ්.යූ.කේ.කෘෂ්
තනතුර -: අධ්‍යක්ෂ (පාලන)VII
දිනය -: 2025.08.15

ඩබ්.යූ.කේ.කෘෂ්
අධ්‍යක්ෂ (පාලන) 07
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ - 10

දිනය -: 2025.08.20

**පරීක්ෂා කළේ :**
අත්සන :- ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම -: නදීකා වික්‍රම ආරච්චි
තනතුර -: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I
දිනය -: 2025.08.18

නදීකා වික්‍රම ආරච්චි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි
අත්සන -: .......................... 08.19
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම -: ජී.එම්.ජනක කිත්සිරි ගුණවර්ධන
තනතුර -: අතිරේක ලේකම්(පාලන) I
නිල මුද්‍රාව -: ..........................

ජී.එම්. ජනක කිත්සිරි ගුණවර්ධන
අතිරේක ලේකම් (පාලන) I
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10

යොමු අංකය - 07/A/02/01/19/2021

**18.** **අමාත්‍යාංශ නිර්දේශය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.04.02 දින අනුමත කරන ලද සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ගණයට අයත් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ..........................................................

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

දිනය - : 2025.08.25

නිල මුද්‍රාව - : විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

---

යොමු අංකය - PSC/EST/06-01-13/04/2025

**19.** **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය 2025.04.02 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන ..........................................................

නම - : ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

දිනය - : 2025-10-10

නිල මුද්‍රාව - : ....................................

ඇමුණුම 01

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අදාළ තනතුරුවල කාර්යයන් ලැයිස්තුව

| අ/අ | තනතුරු නාමය | කාර්යයන් |
|---|---|---|
| 01 | තාක්ෂණ නිලධාරි (ජීව වෛද්‍ය - විශේෂ ශ්‍රේණිය) | • කාලීනව ලැබෙන වෛද්‍ය උපකරණ ස්ථාපනය කිරීම, ආදර්ශන කිරීම, භාවිත කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම හා උපකරණ භාවිත කරනු ලබන රෝහල් කාර්ය මණ්ඩලය අවශ්‍යතාව පරිදි පුහුණු කිරීම.<br>• වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, නිරවද්‍යතාව තහවුරු කිරීම හා ඒ සඳහා අවශ්‍ය නිසි උපදෙස් ලබා දෙමින් අදාළ කාර්යය මණ්ඩලය යෙදවීම, මෙහෙයවීම, කළමනාකරණය කිරීම හා අධීක්ෂණය කිරීම.<br>• වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව සඳහා අමතරව කොටස් ලබා ගැනීම සහ නැවත නිකුත් කිරීමේදී H-500 හා H-503 පොත් සඳහා අනුමැතිය ලබා දීම.<br>• අංශයට අදාළ ඉන්වෙන්ට්‍රි(Inventry) භාරයේ තබා ගැනීම සහ ඉන්වෙන්ට්‍රි(Inventry) ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යෑම.<br>• අධ්‍යක්ෂ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා පත් කිරීම මත, වෛද්‍ය උපකරණ අපහරණය කිරීම සඳහා සහතික ලබා දීම, වෛද්‍ය උපකරණ අපහරණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම.<br>• අධීක්ෂණ කරනු ලබන නිලධාරියාගේ විෂය පථයට අදාළ රාජකාරී කළමනාකරණය කිරීම.<br>• අමතර කොටස් ඇණවුම් කිරීමට අදාළ කටයුතු කිරීම, අවශ්‍ය අමතර කොටස් ලැයිස්තුගත කර ඉදිරිපත් කිරීම, අමතර කොටස් මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී තාක්ෂණ ඇගයීම් කටයුතු සඳහා අංශ භාර ඉංජිනේරුවරයා වෙත සහාය ලබා දීම.<br>• රෝහල්වල ක්‍රියාත්මක වෛද්‍ය උපකරණ නිසි කාල පරාසවලදී ක්‍රමාංකනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු යෙදීම.<br>• තාක්ෂණ නිලධාරි(ජීව වෛද්‍ය), විදුලි වෛද්‍ය යාන්ත්‍රික නිලධාරීන් වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව සඳහා පුහුණු කරවීම හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.<br>• කළමනාකරණ කමිටුවල සාමාජිකත්වය දැරීම.<br>• ආයතන ප්‍රධානියාගේ පත් කිරීම මත තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකත්වය දැරීම.<br>• අධීක්ෂණය කරනු ලබන කාර්ය මණ්ඩලයේ කෙටි නිවාඩු අනුමත කිරීම, අධ්‍යක්ෂ(ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) ගේ අවසරය මත නිවාඩු අනුමත කිරීම, කාර්ය සාධන ඇගැයීම, ගමන් වියදම් හා අතිකාල ආදිය නිර්දේශ කිරීම.<br>• සේවා ගිවිසුම යටතේ පවතින වෛද්‍ය උපකරණවල සිදු කරනු ලබන සේවා හා අලුත්වැඩියා අධීක්ෂණය හා නිර්දේශ ලබා දීම.<br>• නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) හෝ අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) හෝ ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන් ඉටු කිරීම. |

සකස් කළේ :
අත්සන :- ..........................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම - : ඩබ්.යූ.කේ.කෲස්
තනතුර - : අධ්‍යක්ෂ (පාලන)VII
දිනය - : 2025.08.15

ඩබ්.යූ.කේ.කෲස්
අධ්‍යක්ෂ (පාලන) 07
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ - 10

දිනය - : 2025.08.20

පරීක්ෂා කළේ :
අත්සන :- ..........................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම - : නදීකා වික්‍රම ආරච්චි
තනතුර - : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I
දිනය - : 2025.08.18

නදීකා වික්‍රම ආරච්චි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කිරීම
අත්සන ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම - : ජී.එම්.ජනක කිත්සිරි ගුණවර්ධන
තනතුර - : අතිරේක ලේකම්(පාලන) I
නිල මුද්‍රාව - :

ජී.එම්. ජනක කිත්සිරි ගුණවර්ධන
අතිරේක ලේකම් (පාලන) I

ඇමුණුම 02

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| අභියෝගතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා, ආකල්ප අත්පත් කර ගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීණතාවක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි | පැය 01 | 100 | 40% |
| කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම<br>II. කළමනාකරණ ශ්‍රිතයන් (සැලසුම් කිරීම, තීරණ ගැනීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය, සංවිධානය, මාණ්ඩලීකරණය, මෙහෙයවීම, අභිප්‍රේරණ ක්‍රියාවලිය, නායකත්වය,පාලනය, පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය)<br>III. සහභාගීත්ව කළමනාකරණය<br>IV. කළමනාකරණ පරිසරය<br>V. සිද්ධි අධ්‍යයනය | පැය 03 | 100 | 40% |

**විභාගය පවත්වන බලධාරියා -** රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

**විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග -** අවශ්‍යතාව අනුව වර්ෂයකට වරක් පවත්වනු ලැබේ.

**සකස් කළේ :**
අත්සන :- ............................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම -: ඩබ්.යූ.කේ.කෞෂ්
තනතුර -: අධ්‍යක්ෂ (පාලන)VII
දිනය -: 2025.08.15

**පරීක්ෂා කළේ :**
අත්සන :- ............................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම -: නදීකා වික්‍රම ආරච්චි
තනතුර -: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I
දිනය -: 2025 08 18

ඩබ්.යූ.කේ.කෞෂ්
අධ්‍යක්ෂ (පාලන) 07
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ - 10

දිනය -: 2025.08.20

නිර්දේශ කර ඉදිරිපත් කරමි
අත්සන ............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම -: ජී.එම්.ජනක කිත්සිරි ගුණවර්ධන
තනතුර -: අතිරේක ලේකම්(පාලන) I
නිල මුද්‍රාව -: ............................................

ජී.එම්. ජනක කිත්සිරි ගුණවර්ධන
අතිරේක ලේකම් (පාලන) I
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10

ඇමුණුම 03

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අදාළව සේවා පළපුරුද්ද හා කුසලතාව අනුව උසස් කිරීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ආකාරය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **සේවා පළපුරුද්ද**<br>අදාළ මූලික සුදුසුකම් ඉක්මවා ඇති සක්‍රිය හා සතුටුදායක සේවා කාලය | 50 | අදාළ නොවේ |
| **කුසලතාව**<br>(අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටිය අනුව කුසලතාව තීරණය කරනු ලැබේ.) | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

**සම්මුඛ පරීක්ෂණය පවත්වන බලධාරියා -** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසිනි.

**සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග -** අවශ්‍යතාවය අනුව වර්ෂයකට එක්වරක් පවත්වනු ලැබේ.

**සකස් කළේ :**
අත්සන :- ....(signature)....
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම - : ඩබ්.යූ.කේ.කෘෂ
තනතුර - : අධ්‍යක්ෂ (පාලන)VII

දිනය - : 2025.08.15

ඩබ්.යූ.කේ.කෘෂ
අධ්‍යක්ෂ (පාලන) 07
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ - 10

දිනය - : 2025.08.20

**පරීක්ෂා කළේ :**
අත්සන -: ....(signature)....
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම - : නදීකා වික්‍රම ආරච්චි
තනතුර - : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)

නදීකා වික්‍රම ආරච්චි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ 10.

දිනය - : 2025 08 18

**නිර්දේශ කර ඉදිරිපත් කරමි**
අත්සන ....(signature)....
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම - : ජී.එම්.ජනක කිත්සිරි ගුණවර්ධන
තනතුර - : අතිරේක ලේකම්(පාලන) I
නිල මුද්‍රාව - : ....

ජී.එම්. ජනක කිත්සිරි ගුණවර්ධන
අතිරේක ලේකම් (පාලන)
"සුවසිරිපාය"
කොළඹ 10